# රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල - 2018

---------------------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------

කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ගනුදෙනු ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදි ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-------------------------------------------------------------

| | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම<br>(i) ප්‍රමිතිය ප්‍රකාරව අස්තිත්වයක වත්කම් එම අස්තිත්වය විසින් පාලනය කළ යුතු අතර අස්තිත්වයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා එම වත්කම් ප්‍රයෝජනවත් විය යුතුය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල | රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල පිහිටුවීමේ එක් අරමුණක් වන්නේ රේගු කළමනාකරණයෙහි සඵලතාව වර්ධනය කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ | (i) මෙම අරමුදල ශ්‍රී ලංකා රේගුවෙන් වෙනස් වූ වෙනත් අස්තිත්වයක් ලෙස සැලකීම.<br>(ii) අරමුදලේ ප්‍රයෝජනය සඳහා යොදාගන්නා වත්කම් පමණක් එම අරමුදල යටතේ ගිණුම්ගත කල යුතු වීම. |

| | | |
|---|---|---|
| ධාරණ වටිනාකම රු.82,186,416 ක් ලෙස වාර්තා කර තිබුණද, එම වත්කම් අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිතා නොකොට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් එහි මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන බව නිරීක්ෂණය විය. මෙම වත්කම්වලට අදාලව සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රමාණය ලෙස රු.31,627,556 ක වියදමක් ද ගිණුම්ගත කර තිබුණි. | ජනරාල්වරයාට පෙනී යන පහසුකම් සැලැස්වීම සඳහා වියදම් දැරීමයි. ඒ අනුව අරමුදල් වියදම් කොට භාවිතයට ගන්නා ජංගම නොවන වත්කම් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සඵලතාව වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කරන බැවින් ගිණුම් ගත කරන ලද වියදම් එයට අනුකූල නොවේ . | (iii) ශ්‍රී ලංකා රේගුවේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය වත්කම් වැය ශීර්ෂය යටතේ ලැබෙන ප්‍රතිපාදන මත මිලදී ගත යුතු වීම.<br>(iv) රේගුව විසින් පරිහරණය කරන වත්කම් ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය ප්‍රකාශන තුල වාර්තා කල යුතු වීම. |
| (ii.) ප්‍රමිතියේ 21 (ඇ) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සමඟ ඉදිරිපත් කළ යුතු සංරචකයන් අතරින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය එක් සංරචකයක් වුවත් එය වෙනුවට අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් ඉදිරිපත් කර තිබුණි. | මෙම අරමුදලේ ගනුදෙනු වෙනුවෙන් වෙනමම මුදල් පොතක් හා බැංකු ගිණුමක් පවත්වාගෙන නොයන බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් පිළියෙල කිරීම අපහසුය . | ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු බව. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| (අ) කළමනාකරණ හා වන්දි අරමුදලෙහි ගනුදෙනු සටහන් කිරීමේදී පරිපූර්ණ වශයෙන් ද්විත්ව සටහන් ක්‍රමය භාවිතා නොකොට අන්තර් ලෙජර් ගනුදෙනුවල එක් සටහනක් මෙම අරමුදලේ ලෙජර් ගිණුම් තුළද අනෙක් සටහන රේගුවේ ප්‍රධාන මුදල් පොත තුළද සටහන් කරනු ලබයි. ඒ අනුව කළමනාකරණ හා වන්දි අරමුදලෙහි ගනුදෙනු සටහන් කිරීමේදී රේගුවේ ප්‍රධාන මුදල් පොත හා සම්බන්ධ කෙරෙන පාලන ගිණුමක් පිළියෙල කිරීමකින් තොරව ගනුදෙනු සටහන් කරනු ලබන බව නිරීක්ෂණය විය. | දෛනිකව සිදුවන අධික ගනුදෙනු සංඛ්‍යාව අනුව පාලන ගිණුමක් පවත්වාගෙනයාම අපහසු වී ඇති අතර, මාසිකව කළමනාකරණ හා වන්දි අරමුදලේ ගනුදෙනු භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සැසඳීම කරනු ලැබේ. | (i) ප්‍රධාන මුදල් පොත හා සම්බන්ධ කෙරෙන පාලන ගිණුමක් පවත්වා ගෙන යා යුතු වීම.<br>(ii) අරමුදලේ ගිණුම් කටයුතු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව පිළියෙල කර ඇති බව වාර්තා කර ඇති හෙයින් අරමුදලේ සියලු ගනුදෙනු වෙනමම වාර්තා කෙරෙන ගිණුම් පොත් කට්ටලයක් පවත්වා ගැනීම හා ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට විමර්ශන කටයුතු අවසන්ව තිබූ සිද්ධි ලිපිගොනු 91 කට අදාලව පනවා තිබූ දඬ මුදලින් කොටස් වශයෙන් අය කරගෙන තිබූ රු.671,975,900 ක මුදලට අදාල කළමනාකරණ හා වන්දි අරමුදල සඳහා වන සියයට 20 ක දායකය වූ රු.134,395,180 ක වටිනාකම ගිණුම්වලින් අත්හැරී තිබුණි. | සමාලෝචිත වර්ෂය අවසන් වන විට විමර්ශන කටයුතු අවසන්ව ඇති ත්‍යාග ලිපිගොනු අතරින් මුදල් අංශයට ලැබී ඇති ත්‍යාග ගොනු සම්බන්ධයෙන් පමණක් මුදල් අංශයේ ඇති රේගු නිලධාරීන්ගේ ත්‍යාග ලෙජරයේ හා අරමුදල් ලෙජරයේ සටහන් කරන අතර, මුදල් අංශය වෙත ලැබී නොමැති සිද්ධි ලිපිගොනු සම්බන්ධයෙන් වඩා නිවැරදි තොරතුරු ලබා ගැනිමට හැකියාවක් නොමැති බැවින් මේ ආකාරයට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන්නේ නම් උපචිත පදනම මත ගිණුම් සැකසිය යුතු වීම. |
| (ඇ) වියදම් විෂයයන් 6 ක වටිනාකම වූ රු.862,279 ක් අදාල ගිණුම් වෙනුවට වෙනත් ගිණුම් යටතේ ගිණුම්ගතකර තිබුණි. | විගණන නිරීක්ෂණ නිවැරදියි. වැරදි නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාල වියදම් නිවැරදි වැය විෂයයන් යටතේ ගිණුම් ගත කළ යුතු වීම. |

## 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම<br>රු. | වෙනස<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා ලෙජර ගිණුම් | 174,697,212 | 173,594,558 | 1,102,654 | විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා අරමුදලේ ලෙජර ගිණුම සමඟ සැසඳීමේදී මෙම විචලනයන් නිරීක්ෂණය වේ. මෙහි සඳහන් විචලනයන් නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දත්තයන් අතර යම් වෙනස්කමක් වූයේ නම් එම වෙනස්කම් සැසඳීම් කර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු වීම. |
| (ආ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා ලෙජර ගිණුම් | 15,274,686 | 16,377,522 | (1,102,836) | | |
| (ඇ) මාසික දණ්ඩන ආදායම් උපලේඛනය හා ලෙජර ගිණුම් | 176,594,909 | 149,340,099 | 27,254,810 | දණ්ඩන, විකුණුම් හා වෙනත් ආදායම් වර්ගීකරණ දෝෂයක් පවතින අතර, මෙහිදී සමස්ත ආදායමට බලපෑමක් සිදුවී නොමැත. කෙසේවුවද නැවත ආදායම් පරීක්ෂා කර 2019 ගිණුම් ඉදිරිපත් කිරීමේදී 2018 වර්ෂයේ ශේෂයන් නැවත ස්ථාපනය කිරීමට (restate) කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දත්තයන් අතර යම් වෙනස්කමක් වූයේ නම් එම වෙනස්කම් සැසඳීම් කර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු වීම. |
| (ඈ) මාසික විකුණුම් ආදායම් උපලේඛන හා ලෙජර ගිණුම් | 85,674,178 | 112,928,988 | (27,254,810) | | |
| (ඉ) මාසික වෙනත් ආදායම් උපලේඛන හා ලෙජර ගිණුම් | 1,617,956 | 1,448,219 | 169,737 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) භාණ්ඩාගාර පොත් අනුව ආරම්භක ශේෂය හා දෙපාර්තමේන්තු පොත් අනුව ආරම්භක ශේෂය | 6,052,428,678 | 6,050,093,129 | 2,335,549 | මාසික ගනුදෙනු දෙපාර්තමේන්තු පොත් සහ භාණ්ඩාගාර පොත් අනුව සංසන්දනය කිරීම මගින් වෙනස්කම් ඇතිවීම වලක්වා ගැනීමට පියවර ගෙන ඇත. සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට භාණ්ඩාගාර පොත් අනුව අරමුදලේ සමුච්චිත ශේෂය හා දෙපාර්තමේන්තු පොත් අනුව තිබූ ශේෂයන් අතර තිබූ වෙනස රු.2,335,549 සිට රු.1,921,269 දක්වා අඩුවී ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දත්තයන් අතර යම් වෙනස්කමක් වූයේ නම් එම වෙනස්කම් සඳහා මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කල යුතු වීම. |
| (උ) භාණ්ඩාගාර පොත් අනුව අවසාන ශේෂය හා දෙපාර්තමේන්තු පොත් අනුව අවසාන ශේෂය | 6,736,774,748 | 6,734,853,479 | 1,921,269 | | |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 652,931,695 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.728,808,304 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.75,876,609 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට දණ්ඩන ආදායම රු.263,025,305 කින් අඩුවීම හා විදේශ පුහුණු වියදම් රු.41,815,692 කින් හා දේශීය පුහුණු වියදම් රු.15,716,464 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| (අ) රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලෙන්, නිලධාරීන් තිදෙනෙකුගේ විදේශ පුහුණුවීම් වලට අදාලව සමාලෝචිත වර්ෂයේදී රු.1,125,496 ක් වැය කර තිබූ අතර එම විදේශීය වැඩමුළු පැවැත්වූ කාලසීමාව තුල එම නිලධාරීන් විසින් දෙපාර්තමේන්තුව තුළ සේවය කිරීම වෙනුවෙන් අතිකාල මුදල් ලෙස රු.8,333 ක් ලබා ගෙන තිබුණි. | විගණන විමසුමේ සඳහන් විදේශ පුහුණු වැඩසටහන් (රාජකාරි) සඳහා සහභාගි වී ඇති නිලධාරීන් විදේශ ගත කාලසීමාවන් තුළ අතිකාල සේවයේ යෙදී ඇති බවට අදාළ අතිකාල අත්සන් ලේඛන ඒ ඒ අංශ භාර අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කර එවා ඇත. ඒ | (i) අතිකාල ගෙවීම් කිරීමේදී නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම පිළිබඳව කළමනාකාරීත්වයේ මනා අධීක්ෂණයක් පැවතිය යුතු වීම.<br>(ii) අතිකාල ගෙවීම් කිරීමට පෙර අතිකාල ගෙවීම සුදුසු බවට තහවුරු කර |

| | | | |
|---|---|---|---|
| | | සම්බන්ධයෙන් අදාළ අධ්‍යක්ෂ වරුන්ගෙන් මේවනවිට කරුණු විමසා ඇත.<br>එමෙන්ම විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරීන්ගෙන් එම කාලසීමාවන් සඳහා ගෙවා ඇති අතිකාල දීමනා වහාම ආපසු අයකර ගැනීමට කටයුතු කර ඇත. | ගැනීමක් කළ යුතු වීම.<br>(iii) අතිකාල ගෙවීමේ ක්‍රියාවලින් මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් යටතේ ක්‍රියාත්මක කිරීම.<br>(iv) අපරීක්ෂාකාරී ලෙස අත්සන් කර අතිකාල දීමනා ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම.<br>(v) පවතින පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කොට ක්‍රමවත් පාලන පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වීම. |

(ආ) විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i)විදේශ පුහුණු | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව විදේශ පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් තෝරා ගැනීම. | විගණනයේදී පෙන්වා දී ඇති අඩුපාඩු අවම කර ගැනීම සඳහා තවදුරටත් සිදු කළ යුතු වැඩිදුයුණු කිරීම් කෙරෙහි අවධානය යොමු වී ඇත . | විදේශ පුහුණු සඳහා තෝරා ගන්නා සෑම නිලධාරියෙකුම විධිමත් ක්‍රමවේදයක් යටතේ තෝරාගත් බවට සනාථ කල හැකි ලිඛිත කාර්යපරිපාටියක් පවත්වාගත යුතු වීම. |
| (ii) ආදායම් රැස් කිරීම | අරමුදලට ලැබිය යුතු ආදායම් හා ලැබී ඇති ආදායම් සැසඳීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති වීම. | | |
| (iii) ගිණුම්කරණය | ගිණුම් තැබීම හා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත නොවීම. | විගණනයේදී පෙන්වා දී ඇති අඩුපාඩු අවම කර ගැනීම සඳහා තවදුරටත් සිදු කළ යුතු වැඩිදුයුණු කිරීම් කෙරෙහි අවධානය යොමු වී ඇත . | පවතින පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කොට ක්‍රමවත් පාලන පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වීම. |
| (iv) සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම | ගිණුම් ශේෂ සහ ඒවාට අදාල උපලේඛන ශේෂ සමඟ සන්සන්දනයක් සිදු නොකිරීම. | | |
| (v) පාලන ගිණුම් පිළියෙල නොකිරීම | ගනුදෙනු ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධාන ගිණුම සමඟ සම්බන්ධ පාලන ගිණුමක් හරහා සිදු නොවීම. | | |

## 3.2 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| (අ) රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සඵලතා වර්ධනය කිරීම හා නිලධාරීන්ට වන්දි ගෙවීම සඳහා වූ නිශ්චිත නිර්ණායක හා අනාගත අපේක්ෂිත අරමුණුගත වියදම් නිවැරදිව සැලසුම් නොකිරීම හේතුවෙන් වාර්ෂිකව එකතු වෙන මුදල් මගින් අරමුදලේ සමුච්චිත ශේෂය අඛණ්ඩව වර්ධනය වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 6,164 ක් වූ අරමුදලේ සමුච්චිත ශේෂය 2018 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 6,817 ක් දක්වා රු.මිලියන 653 කින් හෙවත් සියයට 11 කින් වර්ධනය වී තිබුණු බව නිරීක්ෂණය විය. එනම් සමාලෝචිත වර්ෂයේ ආදායමින් සියයට 89 ක්ම අරමුදල තුළ සමුච්චනය වී ඇති බව නිරීක්ෂණය විය.<br>අරමුදලේ සමුච්චිත ශේෂය අඛණ්ඩ වර්ධනය සඳහා පහත සඳහන් හේතු ද මූලික වී තිබුණි. | රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සඵලතා වර්ධනය කර ගැනීම සඳහා ලබාදෙන දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා හා වැඩමුළු නිවැරදිව කලින් ඇස්තමේන්තු කිරීමට නොහැකිවීම හා එමෙන්ම නිලධාරීන්ට වන්දි ගෙවීමද සිදුවන සිද්ධීන්ද නිශ්චිතව කලින් ඇස්තමේන්තු කිරීමට නොහැකිවීම නිසා මෙසේ සිදුවී ඇත. එමෙන්ම මෙම අරමුදලට වාර්ෂිකව එකතුවන මුදලද කලින් නිවැරදිව ඇස්තමේන්තු කළ නොහැක. මෙම තත්ත්වයන් තුළ වාර්ෂිකව වෙන් කරන ලද මුදලට වඩා අඩු මුදලක් වැය වීම නිසා අරමුදල වාර්ෂිකව වර්ධනය වේ. | (i) රේගු ආඥා පනත මේ වන විට වසර 51 ක් පමණ පැරණි වන අතර එම කාලය තුළදී තිබූ ආනයන අපනයන තත්ත්වයන් මත එම පනත පිළියෙල කර තිබුණි. එහෙත් එය වර්තමාන ගතික තත්ත්වයන් සැලකිල්ලට ගෙන වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කළ යුතු වීම.<br>(ii) රේගු බදු වංචා අවම කරගත හැකි ප්‍රායෝගික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම මගින් මෙවැනි අරමුදල් තරවීම වලක්වා රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම.<br>(iii) නිලධාරීන්ගේ සඵලතාවය වර්ධනය කර ගැනීම සඳහා වර්තමාන තත්ත්වයට ගැලපෙන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම.<br>(iv) අතිරික්ත මුදල් පිළිබඳව භාණ්ඩාගාරයෙන් විමසා සුදුසු ක්‍රමවේදයක් සැකසීම. |
| (ආ) 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ මෙම අරමුදලට රු.මිලියන 4,790 ක් පමණ මුදලක් බැර කර තිබූ අතර එම කාලය තුල නිමකර තිබුණු රේගු විමර්ශන සංඛ්‍යාව 1653 ක් විය.2017 වර්ෂයේ දී මෙම අරමුදලට රු. මිලියන 362.4 ක් වෙන්කර තිබුණද 2018 වර්ෂයේ දී එය රු. මිලියන 884.09 ක් දක්වා සියයට 144 කින් වර්ධනය වී තිබුණි. | රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර රේගු විමර්ශනවල විකුණුම් හා දණ්ඩන මගින් පනවන ලද දඩ මුදලින් සියයට 20 ක ප්‍රමාණයක් මෙම අරමුදලට බැර කෙරේ. ඒ අනුව මෙවැනි සමුච්චිත ශේෂයක් අරමුදලේ ඇති අතර, වාර්ෂිකව ප්‍රවර්තන ශේෂයන් එයට එකතු වේ. ඒ අනුව අරමුදලේ අගය වාර්ෂිකව ඉහළ යයි. වර්තමාන සමාජය තුල වංචාකාරී ලෙස මුදල් ඉපයීමේ ප්‍රවණතාවය වැඩිවීමේ තත්ත්වය තුල රේගු බදු වංචාවන්ගේ අඩුවීමක් අපේක්ෂා කිරීම අපහසු වේ. | (i) රේගු බදු වංචා අවම කරගත හැකි සැළසුම්ගත ක්‍රියාවලියක් සැකසිය යුතු වීම.<br>(ii) රේගු ආඥා පනත මේ වන විට වසර 51 ක් පමණ පැරණි වන අතර එම කාලය තුළදී තිබූ ආනයන අපනයන තත්ත්වයන් මත මෙම පනත පිළියෙල කර තිබුණද එය වර්තමාන ආනයන අපනයන තත්ත්වයන් සැලකිල්ලට ගෙන |

| | | |
|---|---|---|
| (ඇ) රේගු වැරදි සඳහා දණ්ඩන පැනවීමේදී අහිමි වූ රජයේ බදු ආදායමද එම දණ්ඩනයේ කොටසක් ලෙස සැලකීමත් එම දණ්ඩනය පදනම් කරගෙන නිලධාරීන්ගේ ත්‍යාග තීරණය කිරීමත් හේතුවෙන් නිලධාරීන්ට ගෙවනු ලබන ත්‍යාග මුදල් ප්‍රමාණයේ ඉහළ යෑමක් මෙන්ම මෙම අරමුදලට වෙන්කරන මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් ද සිදු වී තිබුණි. | රේගු වරදක් මඟින් දණ්ඩනයක් පැනවීමට හැකියාවක් ලැබෙන්නේ එම වරද අනාවරණය කර ගැනීමට නිලධාරීන් සූක්ෂමවී කටයුතු කරන නිසාය. එසේ සූක්ෂම වී යම් වරදක් අනාවරණය කරගත්තේ නැතිනම් එම සිද්ධියට අදාළ මුළු ආදායම් ප්‍රමාණයම රජයට අහිමිවන මුදලක් බවට පත්වේ. නමුත් නිලධාරීන්ගේ දක්ෂතාවය මත එම රේගු වරද අල්ලා ගැනීමට හැකිවීම තුළ එකතු කරගන්නා මුදලින් සියයට 30ක ප්‍රමාණයක් රජයට ලැබෙන නිසා රජයේ ආදායමට යම් ප්‍රමාණාත්මක දායකත්වයක් ලැබෙන අතරම, නිලධාරීන් තුළ රේගු වැරදි අල්ලා ගැනීමට ඇති වන පෙළඹවීමද ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකිවේ. | වර්තමානයට ගැලපෙන පරිදි පවතින පනත සංශෝධනය කළ යුතු වීම.<br>(iii) රේගු පරීක්ෂණ ක්‍රියාවලි විධිමත්ව පවතින්නේ නම් රේගු බදු වංචාවන් අවම විය යුතු වන අතර අනාවරණය කර ගන්නා බදු වංචාවලට අදාල රජයට අහිමි වූ බදු මුදල රජයේ ආදායමක් ලෙස සැලකිය හැකි වන ආකාරයෙන් නීතිරීති සංශෝධනය විය යුතු වීම. |
| (ඈ) වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයන හා අපනයනයන්වල ඇතිවී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත හා අදාළ අරමුදල්වල නෛතික විධිවිධාන විධිමත්ව හා කාලීනව සංශෝධනය වී නොතිබීම මෙම වර්ධනයන් සඳහා මූලික වශයෙන් බලපා ඇති බව නිරීක්ෂණය විය. | රේගු ආඥා පනත හා අරමුදල්වල නෛතික විධිවිධාන සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත . | රේගු ආඥා පනත මේ වන විට වසර 51 ක් පමණ පැරණි වන අතර එම කාලය තුළදී තිබූ ආනයන අපනයන තත්ත්වයන් මත මෙම පනත පිළියෙල කර තිබුණද එය වර්තමාන ආනයන අපනයන තත්ත්වයන් සැලකිල්ලට ගෙන වර්තමානයට ගැලපෙන පරිදි පවතින පනත සංශෝධනය කළ යුතු වීම. |
| (ඉ) මෙම අරමුදලේ මූලික අරමුණු අතර එක් අරමුණක් ලෙස රේගු නිලධාරීන් සිය රාජකාරීවල නිරත වීමේදී වන ආපදාවන්ට වන්දි ගෙවීම හඳුනාගෙන තිබුණද, පරීක්ෂාවට භාජනය කරන ලද ඉකුත් වර්ෂ 05 ක කාලපරිච්ඡේදය තුළ එවැනි කිසිදු වන්දි ගෙවීමක් වාර්තා වී නොතිබුණි. ඒ අනුව එම අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් තවදුරටත් මෙම අරමුදලට අසාමාන්‍ය ලෙස මුදල් රැස් කිරීමක් සිදු වී තිබුණි. | රේගු වැරදි අල්ලා ගැනීමට දැඩි කැපවීමකින් කටයුතු කරන අවංක නිලධාරීන්හට ජීවිත තර්ජනද ඇතිවී ඇති බැවින් එම නිලධාරීන්ට ජීවිත අවධානමද නොතකා රාජකාරි වෙනුවෙන් කැපවීමට මෙවැනි අරමුදලක විශාල මුදලක් පැවතීම රක්ෂණ අරමුදලක් මෙන් ඔවුන්ගේ පවුල්වලට හොඳ සුරක්ෂිතභාවයක් | රේගු ආඥා පනත මේ වන විට වසර 51 ක් පමණ පැරණි වන අතර එම කාලය තුළදී තිබූ ආනයන අපනයන තත්ත්වයන් මත මෙම පනත පිළියෙල කර තිබුණද එය වර්තමාන ආනයන අපනයන තත්ත්වයන් සැලකිල්ලට ගෙන වර්තමානයට ගැලපෙන පරිදි පවතින පනත සංශෝධනය කළ යුතු වීම හා රේගු නිලධාරීන්ට වන්දි |

| | | |
|---|---|---|
| | තහවුරු කරයි. එය නිලධාරීන්ගේ රාජකාරි ඉටු කිරීමේදී ජීවිත අවධානම් නොතකා රාජකාරි සඳහා කැපවීමට දිරිගැන්වීමක් සිදු කරයි. | ගෙවීම සඳහා වර්තමාන තත්ත්වයට ගැලපෙන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම හා අතිරික්ත මුදල් සම්බන්ධව භාණ්ඩාගාරය හා සාකච්ඡා කර කටයුතු කිරීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය
-----------------------------------------

### 4.1 අයවැය පාලනය
-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී අරමුදලින් දරන ලද වියදම් විෂයයන් පහකට අදාලව සත්‍ය සංඛ්‍යා හා අයවැයගත සංඛ්‍යා සැසඳීමේදී සියයට 40 සිට සියයට 87 දක්වා වූ පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වීම හේතුවෙන් අයවැය ලේඛනය මනා කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන තිබුණු බව නිරීක්ෂණය නොවීය. | මෙම වියදම් සියයට 100 ක් නිවැරදිව ඇස්තමේන්තු කිරීම අපහසුය. | අයවැය පිළියෙල කිරීමේදී නිසි අවශ්‍යතා හඳුනාගෙන අවශ්‍ය ප්‍රතිපාදනයන් සැලසිය යුතු වීම. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කර තිබූ අරමුදලේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ දක්වා තිබූ වියදම් විෂයයන් තුනකට අදාල අයවැය ගත සංඛ්‍යා සහ සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ අයවැය ඇස්තමේන්තුව තුළ දක්වා තිබූ සංඛ්‍යා අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල ඇස්තමේන්තුගත අගයන් නිවැරදිව දැක්වීම. |